මගේ අංකය
எனது இல.
My No.

Article 12 (1)
Article 12 (11)

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date.
2018/01/22

(3)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

පැමිණිලිකරු : ඊ.එස්.ඩබ් ධම්මික කුසුම් කුමාර මයා.
නො 322. නුවර පාර.
උහන.

වගඋත්තරකරුවන් : 01. සභාපති.
ප්‍රාදේශීය සභාව.
උහන.

02. ප්‍රාදේශීය ලේකම්.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.
උහන.

03. පළාත් පාලන සහකාර කොමසාරිස්.
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය.
අම්පාර.

පැමිණිලි අංකය : HRC/AM/63/13

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. උහන නගරයේ පිහිටි බිම් කොටසක් 2010.09.16 වන දින තමා වෙත පවරාගෙන ඉදිකිරීම් අනුමැතිය සඳහා උහන ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කරන ලද බවත්. අදාළ ස්ථානය ඉදිකිරීම් අවසන් වනතෙක්ම අවශ්‍ය සිතියම් ලේඛන සම්පූර්ණ කළද පුද්ගලික පළිගැනීමක් හේතුවෙන් උහන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ඒ සඳහා අවසරය ලබා නොදෙන බවත්ය.

තවද අදාළ භූමි ප්‍රමාණයට උහන ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුරේඛණය ආදී අවශ්‍ය ලේඛන සියල්ල ඉදිරිපත් කළද. උහන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් සිය බලය අයථා අන්දමින් යොදවා අදාළ අනුමැතිය ලබාදීම වළක්වන බවට කරුණු ඉදිරිපත් කර ඇත.

ප්‍රධාන කාර්යාලය :- අංක 165, කින්සි පාර, කොළඹ - 08.
தலைமைக் காரியாலயம் :- இல 165, கின்சி வீதி, கொழும்பு - 08.
*Head Office* :- No 165, Kynsey Road, Colombo - 08.
*Tele* : +94 -11- 2694925, 2685980, 2685981
**Chairman** : 2696470
**Secretary** : 2689558
**Hotline** : 2689064
*Fax* : +94 11 2694924
*E-Mail* : sechrc@sltnet.lk
*Web* : www.hrcsl.lk
මහල 14, ආර්.ඒ.ද මැල් මාවත, කොළඹ 04

තවද පැමිණිලිකරු විසින් උහන ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගෙන් මෙම ඉදිකිරීම් අනුමැතිය ලබාගැනීමට ගියද ලේකම්වරයා විසින් විවිධ හේතු ප්‍රකාශ කරමින් අදාළ අනුමැතිය ලබා දීම අතපසු කරන ලද බවටත් කරුණු ඉදිරිපත් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු ඉදිරිපත් කිරීම :-

පැමිණිලිකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව වගඋත්තර පාර්ශවයෙන් වාර්තා කැඳවා ඇති අතර එහිදී වගඋත්තර පාර්ශවය විසින් 2013.07.18 දිනැති වාර්තාව මඟින් කරුණු ඉදිරිපත් කරමින්. පැමිණිලිකරු විසින් 2010.06.07 වන දින ගොඩනැගිලි සැලසුමක් අනුමත කිරීම සඳහා වන අයදුම්පත හා ගොඩනැගිලි සැලසුම ලබා දී ඇති බවත්. ඒ සමඟ ඉදිරිපත් කරන ලද ඉඩම් බලපත්‍රය නන්දන පියසේන නැමැත්තෙකුට අයත් වූවක් වන බවත්. පැමිණිලිකරු විසින් නීතිඥවරයෙකු ඉදිරිපිටදී එකී නන්දන පියසේන යන අයට අයත් ඉඩමෙන් කොටසක් පවරාගෙන ඇති බවත් එයට අමතරව එකී ඉඩමේ අයිතිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදෙන ලද ලිපියක් ඇති බවත් දක්වා ඇත.

තවද ගොඩනැගිලි අයදුම්පත්‍රයේ අඩුපාඩු පවතින බවත්. ඉදිකිරීමට අනුමැතිය ලබාදෙමින් උහන ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිකුත් කරන ලද ලිපිය ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම් ප්‍රකාරව අදාළ ඉඩම පර්චස් 4.6 වන බවත්. මොහු නමින් දීර්ඝ කාලීන බදුකරයක් සකස් කිරීමට මිනින්දොරුවරයෙකු විසින් සකස් කරන ලද පිඹුරු පතක්ද ලබා දී ඇති බවත් ප්‍රකාශ කර ඇත.

තවද පැමිණිලිකාර පාර්ශවය විසින් ගොඩනැගිල්ල ඉදිකරන ලද බවත්. එසේ ඉදිකර ඇත්තේ මහාමාර්ග ක්ෂේත්‍රයේ සීමාවට ඇතුළත්ව වන බැවින් ඒ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගැනීම කළයුතු බවට 2012.06.26 දින රැස්වන ලද කමිටු තීරණය වූ බවට සඳහන් කර ඇති අතර 2013.03.27 වන දින පැවැති නිවාස හා සැලසුම් කමිටුවේදී අඩුපාඩු පවතින බවට සඳහන් කර ඇති අතර. එකී අඩුපාඩු වශයෙන්.

01. වාරිමාර්ග ඉංජිනේරු ලිපිය
02. අවශ්‍ය වුවහොත් කඩා ඉවත් කිරීමට කැමැති බවට දුන් ප්‍රකාශ
03. වරිපනම් බදු ගෙවූ බිල්පත්
04. ඉඩම් බලපත්‍රයේ මුල් පිටපත දක්වා ඇත.

එකී අඩුපාඩු නැවත රජයේ මිනින්දෝරුවරයෙකු විසින් මැනුම් කටයුතු කර ඉඩමේ භූමි ප්‍රමාණය නිරාකරණය කර ගැනීමට අවශ්‍ය බවට දැනුම්දී ඇති අතර ඒ අනුව එකී ඉදිකිරීම සඳහා අවම වශයෙන් පර්චස් 04 ක් තිබිය යුතු බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලියවිලි ප්‍රකාරව පර්චස් 2.5 ප්‍රමාණයක් පමණක් පවතින බවටත් එකී තත්වය ගැටළු සහගත බවටත් වාර්තා ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවන් ප්‍රකාරව පැමිණිලිකාර පාර්ශවය විසින් ප්‍රතිවිරෝධතා ඉදිරිපත් කර ඇත.

එකී ප්‍රතිවිරෝධතා ප්‍රකාශය මඟින් උහන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් 2010.06.07 වන දින සිට මේ දක්වා වසර 03 ක කාලයක් ගතකර ඇති බවත්. අදාළ අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් පවතින අඩුපාඩු වරින් වර පැමිණිලිකාර පාර්ශවයට දක්වමින් අනුමැතිය ලබා දීම ප්‍රමාද කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. තවද උහන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ද්වේශ සහගත ලෙස වසර 03 ක් පුරා පැමිණිලිකාර පාර්ශවයේ කාලය. ශ්‍රමය අපතේ යවා ඇති බවට කරුණු ඉදිරිපත් කර ඇත.

විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-

උහන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සහ පැමිණිලිකාර පාර්ශවය යන දෙපාර්ශවයම කැඳවා කොමිෂන් සභාව ඉදිරියේ පරීක්ෂණ කටයුතු මෙහෙයවා ඇති අතර එහිදී පහත කරුණු අනාවරණය වී ඇත.

1. උහන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් දන්වා ඇත්තේ අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීමට පළමුව ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගත යුතු බවයි. එසේ වුවද අනුමැතිය ලබානොගෙන ඉදිකරගෙන යන ලද අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් උහන ප්‍රාදේශීය සභාව විසින් ගන්නා ලද නීත්‍යානුකුල ක්‍රියාමාර්ග කිසිවක් විමර්ශනයේදී අනාවරණය වී නොමැත.

2. පැමිණිලිකාර පාර්ශවය විසින් අදාළ භූමි ප්‍රමාණය තුළ ඉදිකිරීම් සිදුකර තිබියදී සහ ඒ සඳහා ඉඩම් බලධරයා වශයෙන් උහන ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අනුමැතිය ලබා දී තිබියදී සහ උහන ප්‍රාදේශීය සභාවේ නිවාස හා සැලසුම් කමිටුවේදී ගනු ලැබූ තීරණය ප්‍රකාරව පර්චස් 4.6ක ප්‍රමාණය අදාළ භූමිය තුළ දක්නට ලැබේනම් ඒ සඳහා අනුමැතිය ලබා දීමේ හැකියාව ඇති බවට තීරණය කර ඇති බවද දන්වා ඇත.

ඒ අනුව අදාළ මැනුම් නියෝගය සඳහා ප්‍රදේශීය ලේකම් උහන විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර දිවුරුම් පත්‍රයක් මඟින් අන්සතු කරන ලද පැමිණිලිකාර පාර්ශවය විසින් දැනට ඉදිකිරීම් සිදුකර අනුමැතිය ලබා ගැනීමේ ආරවුලට තුඩු දී ඇති ඉඩම පැමිණිලිකාර පාර්ශවය නමින් නීත්‍යානුකුල කිරීමට එනම් දීර්ඝ කාලීන බදු බලපත්‍ර සකස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග උහන ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කරගෙන යන බවද 2013.06.19 වන දින දරණ උහන ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී අමතා යවන ලද ලිපිය මඟින් පැහැදිලි වේ. තවද එකී ඉල්ලීම අනුව මිනින්දෝරු කාර්යාලය අම්පාර මඟින් අදාළ මැනුම් කටයුතු සිදුකර පිඹුරුපත කොමිසමට ඉදිරිපත් කර ඇති බවට 2013.08.29 වන දින දරණ ලිපිය සහ 2013.09.30 දිනැති Tracing No AM/UHN/2013/471 පිඹුර ප්‍රකාරව පැහැදිලි වේ.

3. අදාළ විමර්ශනයේදී අනාවරණය වූ කරුණු අනුව ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නියෝජිතයෙකු පරීක්ෂණය සඳහා කැඳවීමට තීරණය කර ඇති අතර එහිදී 2013.10.14 වන දින දරණ ලිපිය මඟින් අදාළ ගැටළු සහගත ඉඩම සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණයක් කර වාර්තාවක් සකස් කර ඇති බවටත් එම වාර්තාවට අනුව මෙම පැමිණිලිකාර

පාර්ශවයේ ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබාදිය හැකි බැවින් කඩිනමින් අදාළ කටයුතු නිම කර ගැටළුව නිරාකරණය කරන ලෙස උහන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට දැනුම් දී ඇත.

තවද මෙම ගැටළු නිරාකරණය කිරීම සඳහා ක්‍රමවේදයක් වේද යන්න පරීක්ෂා කිරීම සඳහා උහන ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා කැඳවා වැඩිදුර පරීක්ෂණ මෙහෙයවා ඇති අතර. එහිදී ලේකම්වරයා විසින්. ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම සඳහා අදාළ කමිටු රැස්වීම නොපැවැත්වූ බවත්. එහිදී අයදුම්පත. ඉදිකිරීමේ සැලැස්ම. අදාළ ඉඩමේ අයිතිය සනාථ කිරීම සඳහා අයිතිකරුගේ නමින් බලපත්‍රයක් හෝ ඔප්පුවක් යනාදී අවශ්‍යතා සපුරාලිය යුතු බවත් අනාවරණය කර ඇත. තවද පැමිණිලිකරු විසින් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා පෙන්වා දෙන පරිදි පැමිණිලිකරු විසින් 2010.06.16 වන දින දරණ ඉඩම් බලපත්‍රය කල් ඉකුත් වී ඇති බවත්. එකී අඩුපාඩුද සකසාදෙන ලෙස කළ ඉල්ලීම අනුව පැමිණිලිකාර පාර්ශවය විසින් එකී අවශ්‍යතා සියල්ලම සම්පූර්ණ කර ඇති බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම අනුව 2010 වසරේ සිට මේ දක්වාම වගඋත්තරකාර පාර්ශවය විසින් වරින් වර පෙන්වාදෙන ලද අඩුපාඩු සියල්ල සම්පූර්ණ කරදී ඇති බවට දෙපාර්ශවය අතර හුවමාරු වූ ලිපි හා ඉදිරිපත් කරන ලද කරුණු අනුව හෙළිදරව් වේ.

තවද දීර්ඝ කාලීන වශයෙන් සිදුව ඇති ප්‍රමාදය හේතුවෙන් මෙම ගැටළුව සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත 2014.06.03 වන දින සවිස්තරාත්මක වාර්තාවක් යොමුකරන ලද බවත් පළාත් පාලන පනත උල්ලංඝනය කරමින් අදාළ ඉදිකිරීම් පමා කිරීම් සිදුකර ඇති බවටත් තවද අනුමැතිය ලබා දීම පමාවීමේ හේතුවම මතම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අහිමි කර ඇති බවත් එකී ඉදිකිරීමට අදාළ අනෙකුත් බලධාරීන් එනම් ප්‍රාදේශීය ලේකම්. උහන සහ මාර්ග සංවර්ධන අධිකාරිය. වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදී සියළු ආයතන අනුමැතිය ලබා දී ඇති බවත් සඳහන් කර ඇත.

තවද අදාළ ඉදිකිරීම සම්බන්ධව ප්‍රජා සංවර්ධන හා නිවාස කමිටුව මඟින් පෙන්වා දුන් අඩුපාඩු සියල්ල පැමිණිලිකාර පාර්ශවය විසින් සම්පූර්ණ කර ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද විමර්ශනයේදී කරුණු දක්වන්නට යෙදුනු උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නියෝජිතවරයා දන්වා ඇත්තේ. අදාළ පැවරීම නීතිඥවරයෙකු ඉදිරියේ සකස් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් මඟින් සකස් කර ඇති අතර එකී කරුණු ප්‍රාදේශීය සභාව පැමිණිලිකරුගේ අනුමැතිය ලබාදීම සම්බන්ධව තමාගේ විරෝධතාවයක් නොවන බවද දක්වා ඇත.

තවද එකී විරෝධතාවය නිශ්ඵල විරෝධතාවයක් බවට පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා විසින්ද පෙන්වා දී ඇත.

තවද දිගින් දිගටම අනුමැතිය ලබා දීම ගැටළුසහගත වන්නේ ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් වන්නේ නම් එහිදී ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අදාළ භූමි ප්‍රමාණය නියමානුකූල කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන

ඇති බවත් 2008/04 චක්‍රලේඛය යටතේ බලපත්‍ර ලබාගැනීමට ඉදිරිපත්වීමේ කිසිදු බාධාවක් නොවන බවත් පෙන්වා දී ඇත.

තවද උහන ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ දැඩි ස්ථාවරය වන්නේ අදාළ ඉදිකිරීම අනුමැතිය ලබා දීම සඳහා ඉඩම් බලපත්‍රය තමාගේ නමින්ම පැවතිය යුතු බවයි.

තවද අම්පාර ප්‍රදේශයේ පවතින ඉඩම්වලින් බහුතරයක් ඉඩම් රජයේ ඉඩම් වන බවත්, එකී ඉඩම් විශේෂයෙන්ම නාගරික සීමාවන් තුළ පිහිටි ඉඩම් සඳහා බලපත්‍ර ලබා දී නොමැති බවත්, එසේ තිබියදී උහන නගරයේ සිටින අනවසර එහෙත් ඉදිකිරීම් සිදුකර ඇති සැලසුම් අනුමත කර තිබියදී ද්වේශ සහගතව පැමිණිලිකරුගේ අනුමැති ලබාදීම පමා කිරීම තුලින් නීතිය ඉදිරියේ සියළු දෙනා සමානය යන තත්වය වෙනස් ලෙස සළකමින් අසමාන ආකාරයේ සැළකීමක් සිදුකර ඇති බවට දක්නට ලැබෙන බව නිරීක්ෂණය වේ.

තවදුරටත් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා නියෝජනය කරමින් දන්වා ඇත්තේ. ගොඩනැගිලි අනුමැතිය ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඒ සඳහා හේතු සාදක දැක්විය යුතු බවත් එසේ හේතු සාදක නොදැක්වීම මත එකී නිලධාරීන්ගේ අසද්භාවී ක්‍රියා සම්බන්ධයෙන් වන්දි ඉල්ලා සිටීමේ අයිතිවාසිකම් ඉන් අගතියට පත්වන පාර්ශවයට පවතින බවද පෙන්වා දී ඇත.

තවද නැගෙනහිර පළාත් සභාවේ පළාත් පාලන ප්‍රඥප්තිය සම්මත වී නොමැති බැවින් අදාළ ඉදිකිරීම සිදුකළද එය කඩා ඉවත් කිරීමේ හැකියාව උහන ප්‍රාදේශීය සභාවට නොපවතින බවත් පෙන්වා දී ඇත. ඒ අනුව අදාළ ගැටළු නිරාකරණය කිරීම සඳහා 2014 අප්‍රේල් මස උහන ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේදී ද සාකච්ඡා කර ඇති බවත් එහිදී මතභේදයට තුඩු දී ඇති ඉඩම් ප්‍රමාණය එනම් උහන ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා දක්වන පරිදි අවමය පර්චස් 05 ක බිම් ප්‍රමාණය යන්න සංශෝධනය වී ඇති බවත් කිම්වු වාර්තාව අනුව පෙනී යයි. ඒ අනුව බලන විට අනෙකුත් නිර්ණායක සම්පූර්ණ කර ඇත්තේ නම් පැමිණිලිකාර පාර්ශවයේ ගොඩනැගිලි අනුමැතිය ලබා දීම සඳහා කිසිදු බාධාවක් වගඋත්තර පාර්ශවයට තිබිය නොහැකි බව නිරීක්ෂණය වේ. ඒ අනුව එකී සභාවේ අනුමැතියද නොතකා කටයුතු කිරීමට උත්සහ කිරීම තුලින් උහන ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා බලය අයුතු ලෙස භාවිත කරමින් සහ ද්වේශ සහගත ලෙස කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

සමස්ථයක් වශයෙන් ගත්කළ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 12(2) ව්‍යවස්ථාවන් මඟින් සුරක්ෂණය කර ඇති මූලික අයිතිවාසිකම් පැමිණිලිකරු සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් විශේෂයෙන්ම උහන ප්‍රාදේශීය සභාව විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඉහත කරුණු අනුව පැමිණිලිකරුගේ ගොඩනැගිලි අනුමැතිය ලබා දීම සඳහා බාධාවක් නොමැති බවට නිරීක්ෂණය වන බැවින් අදාළ ඉදිකිරීම් අනුමැතිය ලබා දීමට පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2018.0[illegible] .[illegible] දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද මැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/